
**පරිසරය**

## පාරිසරික සංචාරකයන්ට අත වනන
# ජාතික නාමල් උයන හා රෝස තිරිවානා කඳුවැටිය

යූ.පී.එස්.පතිරණ



සොබාදහම සැමවිටම අපූරු නිමැවුම් මවයි. වරෙක නෙත්සිත් මත් කරවන දසුන් මවන අතර, තවත් වරෙක නෙත්සිත් සතපන හා බවුන් වඩවන පරිසර මවයි. එබඳු ගුණාංග සැමෙකක් ම එක්තැන් වූ සොබාදම් දිතිතිය ගේ තවත් අපූරු නිර්මාණයක රස විඳින්නට නම් ඔබ යා යුත්තේ ජාතික නාමල් උයනට යැයි කීවොත් එය අඩි තක්සේරු කිරීමක් නොවනු ඇත.

කොළඹ සිට කි.මී. 160ක පමණ දුරින් දඹුල්ල සිට කැකිරාව මාර්ගයේ මඩාටුගම හන්දියෙන් හැරී ආඩියාගල පාරේ ගිය විට හමුවන ගල්කිරියාගම, උල්පතගම ගම්මානයේ නාමල් උයන පිහිටා තිබේ. ජාතික නාමල් උයන සංකල්පයේ නිර්මාතෘ පරිසර හිතකාමී වනවාසී රාහුල හිමියන් විසින් මෙම අසහාය සෞන්දර්යාත්මක වන පෙත සොයා ගන්නා විට එය හුදෙක් දව හොරුන් ගේ, නිදන් හොරුන් ගේ හා මස් වැද්දන් ගේ අඩබිමක් බවට පත් වී තිබිණ.

දිගු සංසාර ගමනේ පතාගෙන ආ ලෙස පරිසරය හා පැවති ලබැඳියාව අනුව 1991 වර්ෂයේ මාර්තු මස 28 වැනි දින මෙම නා වනයට පැමිණි රාහුල හිමියන් විසින් දහසකුත් කම්කටොළු විඳ දරා ඉටු කළ ජාතික මෙහෙවරක ප්‍රතිඵලයක් වශයෙන් අද ජාතික නාමල් උයන ආරක්ෂා වී තිබීම ජාතියේ වාසනාවකි.

ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවේ ජාතික වෘක්ෂය වන mesua ferrea යන උද්භිත නාමයෙන් හඳුන්වනු ලබන නා ගස් ගහණයෙන් සමන්විත වූ මෙම ද්විතියික වනාන්තරය අක්කර 260 කින් පමණ සමන්විත වේ. ශ්‍රී ලංකාවේ විශාලතම නා උයන වන නාමල් උයන සමග දකුණු ආසියාවේ විශාලතම රෝස තිරිවානා නිධිය වශයෙන් සැලකෙන රෝස තිරිවානා කඳුවැටිය විශේෂ පාරිසරික පද්ධතියකින් හා ජෛව විවිධත්වයකින් යුතු මහඟු සම්පතක් වේ. දැනට ශ්‍රී ලංකාවේ සිංහරාජ වනයේ පමණක් දක්නට ලැබෙන දිය නා හා බටු නා යන ශ්‍රී ලංකාවට ආවේණික නා වර්ග දෙකම නාමල් උයනේ බහුලව ඇත.

ඓතිහාසික වටිනාකම ගැන සැලකීමේ දී මෙම නා වනයේ ඉතිහාසය අනුරාධපුර යුගයේ මුල් අවධිය තෙක් විහිද යන බව පෙනේ.

දේවානම් පියතිස්ස රජු විසින් මහ මෙවුනා උයන පිහිටුවීමට පෙරාතුව එබඳු උයනක් මෙහි පිහිටුවීමට සැලසුම් කල බවත්, පසුව යම් හේතුවක් නිසා අනුරාධපුරයේ මහමෙවුනා උයන පිහිටු වූ බවත් විශ්වාස කැරේ. කෙසේ වුවද සිව්වන දප්පුල රජු (ක්‍රි.ව.924) විසින් මෙම වනය අභය භූමියක් වශයෙන් ප්‍රකාශයට පත් කළ බවට සනාථ කෙරෙන ගල් කුලුනක් නාමල් උයනට පිවිසෙන ආඩියාගල මාර්ගයේ උල්පතගම හන්දියේ පාර මැද දක්නට ලැබේ. අටවන සියවසේ දී පමණ එළිමහන් සිර කඳවුරක් වූ මෙම වනයට පැමිණි සිරකරුවන් විසින් දඬුවමක් වශයෙන් නා පැළ රෝපණය කළ බවට විශ්වාස කැරේ.

> කොළඹ සිට කි.මී.160ක පමණ දුරින් දඹුල්ල සිට කැකිරාව මාර්ගයේ මඩාටුගම හන්දියෙන් හැරී ආඩියාගල පාරේ ගිය විට හමුවන ගල්කිරියාගම, උල්පතගම ගම්මානයේ නාමල් උයන පිහිටා තිබේ.

කෙසේ හෝ වේවා නාමල් උයන තුළ දක්නට ලැබෙන මටසිළුටු ගල්කණු, සඳකඩ පහණ, ශ්‍රී පාද ලාංඡනය සහිත පූජාසනය, බෝධිඝරය ඇතුළු පුරාවිද්‍යා නෂ්ටාවශේෂ බොහොමයක් ම මෙම වනයෙහි ඉතිහාසය ක්‍රි.පූ. තෙවන සියවස පමණ තෙක් විහිද ඇති බව පෙන්නුම් කැරේ.

අවට පිහිටි වැව් රැසකට ජල පෝෂක වනාන්තරයක් වශයෙන් මෙම නාමල් උයන තුළ දැකිය හැකි සුවිශේෂ අංග රැසකි. පැරණි ගැමියන් අතර, උණුගල් දෙබල යනුවෙන් ප්‍රකට රෝස තිරිවානා කඳුවැටියට වන මං පෙත් ඔස්සේ පියවර මනිද්දී නෙත ගැටෙන මනහර දසුන් අතරට කඳු මුදුනේ සිට ගලා එන සවිරාම ජල රටාවක් සහිත සිසිල් දිය දහරවල් මහත් ආශ්වාදයක් ලබා දෙයි. කඳු මුදුනේ සිට සිහින්ව පහළට ගලා එන එම සිහින් දිය දහරක් ඕවලාකාර ගල් පාත්‍රයකට වැටෙයි. සතරවරම් දෙවිවරුන් උදෙසා දැල්වූ නිරහනරක් සහිත පහනක් සේ හැඳින්වෙන මෙම ගල් පාත්‍රය පැරණි ගැමියන් හඳුන්වා ඇත්තේ, ගල් අප්පල්ලෙ යනුවෙනි. ගල් පාත්‍රයට වැටී උතුරා යන එම දිය දහර මඳ දුරක් ගලා ගොස් ඇස් පනා පිට පොළව තුළට නොපෙනී යයි. එය නැවත මතුවන්නේ, ඊට සැතපුමක් පමණ දුරින් පිහිටි පැරණි ගැමියන් විසින් ඌරා කොටේ යැයි හඳුන්වන ස්ථානයෙකිනි. එම ගම්මානයට උල්පතගම යන්න යෙදී ඇත්තේ , මෙසේ දියවැලක් උල්පතකින් මෙන් මතු වීම නිසා බව පැවසේ.

රජරට වියළි කලාපයේ පිහිටි වනාන්තරයක් වුවද නාමල් උයනේ දක්නට ලැබෙනුයේ තෙත් කලාපයේ වැවෙන වෘක්ෂ ලතා වේ. උදහරණ: මෙහි ප්‍රමුඛ ශාකය වන නා ගස තෙත් කලාපයේ පැළෑටියෙකි. මෙම වනය තුළ බොහොමයක් ඖෂධ පැළෑටි දක්නට ලැබෙන අතර දැනට එබඳු ශාක 78 ක් පමණ හඳුනාගෙන තිබේ. කළු වෙලන්ගිරිය, දෙමට, කටි බැබිල, දික්වැන්න, මිංගො කරපිංචා, බිම්පොල්, අන්දර, රත්මල්, ගොනක්කා, රම්මානිස්ස, මකුළු, කම්පිල, බිංතෙල්, මයිල, පඹවැල්, පොටාවැල්, කුරටිය, දියමිත්ත, ගොඩරත්මල්, හිරුස්ස පළු,



කොබ්බෑ, කැල වෙලං, විශ්ණුක්‍රාන්තිය, රදලිය, කරපිංචා, වල්මිදි, තිත්ත කඳුරු, අක්මැල්ල, සේරු, හීං බුලත්, මදුරුතලා, ඉගිනි, දවුල් කුරුඳු, තඹල ආදිය ඉන් සමහරකි.මෙම වනාන්තරයේ තවත් විශේෂත්වයක් වනුයේ මෙය ද්විතියික වනාන්තරයක් වුවද, සාමාන්‍යයෙන් ද්විතියික වනාන්තරයක දැකිය හැකි බීජ රෝපණ අවස්ථා (seedling) හා වන ස්වරූපය පිළිබඳ විශාල වෙනසක් දක්නට ලැබීම යි.

මෙම වනයේ රෝපිත සමහර නා ගස් (Ironwood) අවුරුදු 500 කටත් වඩා පැරණි යැයි විශ්වාස පවතී. එපමණක් නොව මෙහිදී දැක බලා ගත හැකි පක්ෂි විශේෂ සංඛ්‍යාව 18 ක් පමණ වේ යැයි ගණන් බලා තිබේ. එනම්, ලංකා සිතැසියා, ගිරා මලිත්තා, පිතකන් කොණ්ඩයා, වී කුරුල්ලා, මහ බකමූණා, අලුහැලන් පෙන්ද, ඉන්දියානු කෝකිලයා, කවුඩා, කොහා, ගෝමර කොණ්ඩ කොහා, වන නිල් මල් කොහා, අවුරුදු කොහා, විවර තුඩුවා, පාදිලි මාතාවා, තාපස බකමූණා ආදී පක්ෂි විශේෂ වේ. වන මංපෙත්වල ඇවිදගෙන යද්දී හමුවන කුඩා ගොළුබෙල්ලකු ශ්‍රී ලංකාවේ වෙනත් තැනක හමු නොවන, දැනට වඳවී යාමේ තර්ජනයට මුහුණපා ඇති එක් ගොළුබෙලි විශේෂයක් (mollus species) ලෙස ද සැලකේ.

**පැරණි ගැමියන් අතර, උණුගල් දෙබල යනුවෙන් ප්‍රකට රෝස තිරිවානා කඳුවැටියට වන මං පෙත් ඔස්සේ පියවර මනිද් දී නෙත ගැටෙන මනහර දසුන් අතරට කඳු මුදුනේ සිට ගලා එන සවිරාම ජල රටාවක් සහිත සිසිල් දිය දහරවල් මහත් ආශ්වාදයක් ලබා දෙයි.**

දකුණු ආසියාවේ විශාලතම රෝස තිරිවානා නිධිය වශයෙන් විශ්වාස කෙරෙන මෙහි රෝස තිරිවානා කඳුවැටිය (Rose Quartz Mountain Range) අවුරුදු මිලියන 4000 ක් පමණ දී ඇතිවූ පැරණි සුදු, රෝස, දම්, පැහැති තිරිවානා ගලින් සැදුම්ලත් මුදුන් 7 ක් සහිත කඳු යායකි. සිලිකන් සහ ඔක්සයිඩ් නම් වූ ලෝහ වර්ගය නිසා මෙම කඳුවැටියේ එම වර්ණයන් ගෙන දීමට හේතුවී ඇති බවත්, ඒ නිසාම කඳුවැටිය විශාල වශයෙන් ඛාදනයට භාජනය වෙමින් පවතින බවත්, පෙනී යයි. විශේෂයෙන් ජර්මන් ජාතිකයින් විසින් පූජනීය වස්තුවක් ලෙස සලකනු ලබන තද හා සැහැල්ලු පාෂාණ විශේෂයක් වූ එය රොකට් යාන්ත්‍රිකරණ යේ දී සියුම්ව යොදගත හැකි බවත්, එහි අර්ධ මැණික් සංයෝග ඇති බවත් සැලකේ.

ඉන්දියාවේ මෝගල් රජෙකු වන ෂාජහාන් විසින් තම පෙම්බර මුම්ටාෂ් දේවිය සිහිවීම පිණිස ඉදිකරන ලද අසහාය ආදර ස්මාරකය වන ටජ්මහල් මන්දිරයේ රෝස පැහැති ජනේලය සඳහා මෙම රෝස තිරිවානා යොද ගත් බවට වාර්තා වී තිබේ.

නාමල් උයන තුළ පුරා විද්‍යාත්මක නටබුන් රැසක් ද දක්නට ලැබේ. පුරා විද්‍යා දෙපාර්තමේන්තුව විසින් සංරක්ෂණය කරන ලද කුඩා චෛත්‍යයක් ද, චතුරශ්‍රාකාර බෝධි ඝරයක් ද, පුරාණ විහාරයක හා මාලිගාවක යැයි සැලකෙන නටබුන් ද ගලෙහි කොටා ඇති පියගැට පෙලක් ද ඒ අතර වේ. මීට අමතරව මෑත කාලයේ රෝස තිරිවානා කඳු මුදුනත ඉදි කර ඇති සමාධි බුදු පිළිමයක් හා තවත් බුදු පිළිමයක් ද රෝපණය කරන ලද බෝධියක් ද වේ.

ජාතික නාමල් උයන දේශීය වශයෙන් කොතෙක් දුරට ජනප්‍රිය වී ඇත්තේ ද යන වග දිනපතා එහි ඇදී එන පාසල් සිසුන්, වන්දනාකරුවන් ඇතුළු දේශීය සංචාරකයින් ගේ විශාල ප්‍රමාණය අනුව පෙනී යයි. සංඛ්‍යාත්මක වශයෙන් සලකන විට සමහර කාල වල දී දේශීය සංචාරකයින් ගේ පැමිණීම මසකට 50,000 ඉක්මවා යන බව දක් වේ.

දැනට ජාතික නාමල් උයනේ සම්පත් ප්‍රතිලාභීන් (Stakeholders) වශයෙන් සැලකෙනුයේ වනජීවී දෙපාර්තමේන්තුව, වන සම්පත් දෙපාර්තමේන්තුව, පුරා විද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික නාමල් උයන සංවර්ධන පදනම හා ප්‍රදේශයේ ප්‍රජාව වේ. ආගමික සිද්ධස්ථානයක් වශයෙන් නොව පාරිසරික හා භූ විද්‍යාත්මක වැදගත්කමක් ඇති සම්පත් මධ්‍යස්ථානයක් වශයෙන් හා පාරිසරික සංචාරකයන්ට (Eco – Tourists) සොබා සිරි විඳ දරා ගනිමින් වන මංපෙත් ඔස්සේ ඇවිදගෙන යා හැකි පාරිසරික සංචාරක මධ්‍යස්ථානයක් වශයෙන් ජාතික නාමල් උයන තිරසාර (ධරණීය) සංවර්ධන මාවතකට යොමු කිරීමට ජාතික නාමල් උයන සංවර්ධන පදනම අපේක්ෂා කෙරේ. මෙම සංවර්ධන පදනමේ සභාපති ධූරය උතුරු මැද පළාතේ ප්‍රධාන අමාත්‍ය ගරු බර්ටි ප්‍රේමලාල් දිසානායක මැතිතුමා හොබවනු ලබන අතර, වනවාසී රාහුල හිමියන් විධායක අධ්‍යක්ෂවරයා වශයෙන් කටයුතු කරයි.

මීට අමතරව විශේෂයෙන් දේශීය සංචාරකයන් නිසා පරිසරයට සිදුවිය හැකි හානි අවම කිරීමේ අරමුණෙන් මාර්ගෝපදේශක සේවයක් ද හඳුන්වා දී තිබේ. මේ අනුව ජාතික නාමල් උයන ආශ්‍රිත ප්‍රදේශයේ පදිංචි රැකියා විරහිත උගත් තරුණ තරුණියන් විසි දෙනෙකු ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ අනුග්‍රහය ඇතුව මාර්ගෝපදේශකයන් වශයෙන් පුහුණු කර දැනට සේවයෙහි යොද ඇත. මේ අතර අනවසර පදිංචිකරුවන් විසින් තවදුරටත් ඉඩම් අල්ලා ගැනීම වැලැක්වීම සඳහා ජාතික නාමල් උයනේ නිසි මායිම් සනිටුහන් කර ජාතික සම්පතක් වශයෙන් එය සංරක්ෂණය කිරීමට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් දැනටමත් සැලසුම් කර ඇති බව ද පෙනී යයි. කෙසේ හෝ වේවා ජාතික උරුමයක් වශයෙන් ජාතික නාමල් උයන අනාගත පරපුරට සංරක්ෂණය කර තැබීම පරිසර හිතකාමී අප සැම ගේ ජාතික මෙහෙවරක් වන බව ද අවසාන වශයෙන් සඳහන් කළ යුතු ය. ❑